<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!</u>

# ‘පටික්කූලමනසිකාරය’ - ශරීර කොටස් පිළිකුල් වශයෙන් මෙනෙහි කිරීමේ භාවනාව

**<u>(මෙය අසුභ භාවනාව, පිළිකුල් භාවනාව නමින් ද හැඳින්වේ.)</u>**

*<u>පාළි පාඨය :-</u>*

**“අත්ථි ඉමස්මිං කායේ : කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ, මසං, නහාරු, අට්ඨී, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, (මත්ථලුඞ්ගං), පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලෝහිතං, සේදෝ, මේදෝ, අස්සු, වසා, ඛේලෝ, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං” ති.**

*<u>අරුත් සහ විස්තර:</u>*

**1) <u>කේසා - හිස කෙස් - head hair</u>**

කෙස්, ප්‍රකෘති වර්ණයෙන් කලු, තද දුඹුරු, තඹ ආදී විවිධ පැහැයන්ගෙන් විද්‍යාමානය. සටහනින් ඇතමෙකුගේ කෙස් තල්කෙඳි මෙන් සෘජුව ද ඇතමෙකුගේ වක ගැසී, කැරලි ගැසී ද ඇත්තේ ය. දෙපසින් කන්සිළු වලින් ද ඉදිරිපස නළලින් ද පිටුපස ගෙළෙහි ඉහළ කොටසින් ද සීමා වූ හිස් කබල වසා තිබෙන සම, කෙස් පිහිටි අවකාශය යි. හිස කෙස් දින කිහිපයක් නොසේදුවහොත් දුර්ගන්ධ වන්නේ ය. කෙස් පිළිස්සෙන විට ඇතිවන දුර්ගන්ධය වඩාත් පිළිකුල් වේ. අසුචි ගොඩක හටගත් පුස් මෙන් ද සොහොනෙහි කසල ගොඩ හටගත් පලා මෙන් ද අවශේෂ කුණපු රාශිය මත හටගත් මෙම කෙස් පිහිටි ස්ථානය වශයෙන් ද පිළිකුල්ම ය. (හිසින් ගිලිහුණු කෙස් ගසක් ආහාර බඳුනක තිබෙනු දුටුවහොත් එම ආහාර බඳුන ද පිළිකුල් කරමින් බැහැර ලන්නේ ය.) කෙස් පිහිටි දිශාව අයත් වනුයේ නාභියෙන් උඩ දිශාවට ය.

**2) <u>ලෝමා - ලොම් - body hair</u>**

ලොම්, ප්‍රකෘති වර්ණයෙන් (කෙස් මෙන්) ඉතා තද කලු පැහැයෙන් යුතු නොවෙතත් කලු, දුඹුරු, තඹ ආදී විවිධ පැහැයන්ගෙන් විද්‍යාමානය. සටහනින් අග නැමී ගිය තල්මුල් බඳු ය. ලොම් ශරීරයේ නාභියෙන් උඩ - යට යන දෙදිශාවෙහිම පිහිටියේ ය.

**3) <u>නඛා - නියපොතු - nails</u>**

ඇඟිලි අග පිහිටි විසි නියපොතු ප්‍රකෘති වර්ණයෙන් බොහෝ සෙයින් සුදු පැහැයට හුරු ය. සටහනින් මසුන්ගේ කොරපොතු බඳු ය. අත්වල නිය නාභියෙන් උඩ දිශාවෙහි ද පා නිය පොතු නාභියෙන් යට දිශාවෙහි ද පිහිටියේ ය.

**4) <u>දන්තා - දත් - teeth</u>**

සම්පූර්ණයෙන් වැඩුණු සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ දත් සංඛ්‍යාව (සාමාන්‍යයෙන්) තිස් දෙකකි. වර්ණයෙන් සුදුපැහැති වූ දත් සටහනින් නොයෙක් ආකාර ඇත්තේ ය. දත්, හනු ඇටවල පිහිටා තිබෙන අතර නාභියෙන් උඩ දිශාවට අයත් වේ. මැලියම් බැඳීමෙන් දුර්වර්ණ වන්නා වූ ත් දත්වල සිදුරු සෑදී දිරාපත් වන්නට වූ කල්හි තදින් දුගඳ හමන්නා වූ ත් මෙම දත් මැටි පිඬෙක පිළිවෙලින් තැබූ කැකිරි ඇට පෙලක් මෙන් ඉතා පිළිකුල් සහගත ය.

**5) <u>තචො - සම - skin</u>**

මුළු ශරීරයම වසා පැතිර තිබෙන සම මෙයින් අදහස් වේ. සමට මතුපිටින් කලු, තළෙලලු ආදී වර්ණයන්ගෙන් යුතු සිවියක් ඇත. එම සිවියට යටින් පිහිටි සම සුදු පැහැති ය. ගින්නෙන් පිළිස්සුනු තැන්හි හා ආයුධ පහරින් තුවාල වූ තැන්හි එම සුදුපැහැති සම දැකිය හැකිය. සම, ශරීරයේ සටහනින් යුතු ය. උඩ - යට දෙදිශාවටම අයත්වන අතර මුළු ශරීරය වසා පැතිර පවතී.

සියලු ආකාරයේ සොරි, දද, වණ, කුෂ්ඨ හටගන්නා වූ මෙම සම පිළිස්සුණු තැන්වල ඉතා පිළිකුල්ව දිස්වේ. සම පිළිස්සෙන කල්හි ද ඉතා අප්‍රසන්න පුළුටු ගඳක් වහනය වේ. සුදු කබර, වණ කැළැල්, පිළිකා හටගන්නා මෙම සම ජරා-ජීර්ණ වන විට තල කැළැල් සෑදී දුර්වර්ණ වී නියං සමයෙහි පුපුරා ඉරි තලා ගිය පොළොවක්සේ රැළි වැටී අශෝභන වේ.

**6) මංසං - මස - flesh / muscles**

ශරීරය පුරා පැතිර සිටි මස් පිඬු වර්ණයෙන්, රතු පැහැයට හුරු ය. ශරීරයේ ඒ ඒ තැන පිහිටි මස් පිඬු විවිධ සටහනින් යුතු ය. උඩ, යට දෙදිශාවෙහිම පිහිටි මෙම මස් පිඬු යට ඇට සැකිල්ල වෙලාගෙන ඇති අතර මතුපිට සමින් ආවරණය වී ඇත.

කෝටුවලින් සැකිල්ල සාද මැටි පිරවූ බිත්තියක මෙන් ඇට වලින් සැදුණු ශරීර කූඩුව පිරී ඇත්තේ පිළිකුල් මස් පිඬු වලිනි. පිළිස්සෙන විට ඉතා අප්‍රසන්න පුළුටු ගඳක් වහනය වන්නා වූ මෙම මස් පිඬු ප්‍රකෘතියෙන් ද අප්‍රසන්න පිළී ගඳින් යුතු ය. තුවාල, වණ, පිළිකා හටගෙන ලේ - සැරව වැගිරෙන්නට වූ කල්හි මෙම මස් පිඬු අතිශයින්ම පිළිකුල් සහගත ය.

**7) නහාරූ - නහර (බන්ධන හා කණ්ඩරා) - sinews / tendons**

ශරීරය පුරා විහිදී පැතිර ඇති මෙම නහර වර්ණයෙන් සුදු පැහැයට හුරුය. ශරීරයේ උඩ - යට දෙදිශාවෙහි පිහිටි මෙම නහර නොයෙක් සටහනින් යුතු ය. ගසක් වෙලා පැතිර පවතින රසකිඳ වැලක මුල් මෙන් ද අවුල් වූ තන්තු ජාලාවක් මෙන් ද පිළිකුල් සටහනින් යුතු ය. ශරීරයේ අස්ථි පද්ධතිය හා මාංශ පේශීන් එකිනෙක සම්බන්ධව පවතින්නේ මෙම නහර වලිනි. එයින් මහත් වූ නහර 'කණ්ඩරා' නාමයෙන් හැඳින් වේ. (මෙයින් අදහස් වන්නේ රුධිරවාහිනී නාළ නොවේ.)

**8) අට්ඨී - ඇට - bones**

දත් ඇට හැර අවශේෂ සියලුම ඇට, එනම් හිස් කබල, හනු ඇට, ගෙළ ඇට, උරහිස් ඇට, බාහු හා අත්වල - ඇඟිලිවල ඇට, කොඳු ඇට, ඉළ ඇට, උකුල් ඇට, කලවා ඇට, කෙණ්ඩා ඇට, ගොප් ඇට, පා ඇඟිලි ඇට, ආදී මේ ශරීරයේ සැකිල්ල වන අස්ථි පඤ්ජරය වර්ණයෙන් සුදු ය. සටහනින් විවිධාකාරය. මසින් වැසී නහර, ස්නායු තන්තු ආදියෙන් වෙලී එකිනෙක සම්බන්ධ වී පවතින මෙම ඇටසැකිල්ල ස්වභාවයෙන්ම ඉතා පිළිකුල් ය. බියකරු පෙනුමකින් යුක්ත ය. මසින් පිරී සමින් වැසී ගිය කල්හි ඇතැමෙකුගේ ශරීර ස්වභාවය නෙත් සිත් පැහැර ගන්නා රූප සම්පත්තියකින් යුක්තවූවත් එම සම්, මස්, ලේ ඉවත් කළ කල්හි මතුවන ඇටසැකිල්ල දුටු සැනින්ම පිළිකුල ත් බිය ත් නොකැමැත්ත ත් ඇති වේ.

**9) අට්ඨිමිඤ්ජා - ඇටමිදුළු - bone marrow**

ඇට අභ්‍යන්තරයෙහි පිහිටා ඇති ඇට මිදුළු වර්ණයෙන් සුදු පැහැති ය. නාභියෙන් උඩ - යට යන දෙදිශාවටම අයත් වේ.

**10) වක්කං - වකුගඩු - kidney**

එකිනෙක සම්බන්ධ වූ හෘදයට පහතින් දෙපස පිහිටි අවයව යුග්මයකි. වර්ණයෙන් මඳ රත් පැහැති ය. එක නටුවෙහි හටගත් අඹ ගෙඩි දෙකක් බඳු සටහනින් යුතු ය. නාභියෙන් උඩ දිශාවෙහි පිහිටි අතර පිළීගඳ හමන මස්පිඬු දෙකක් මෙන් සටහනින් ද ගන්ධයෙන් ද පිළිකුල්ම ය.

**11) හදයං - හදවත - heart**

වර්ණයෙන් රතු නෙළුමක පැහැයෙන් යුතු වන අතර සටහනින් යටිකුරු කළ නෙළුම් කැකුලක් බඳුය. හෘදය අභ්‍යන්තරයෙහි රුධිරය සංසරණය වන කුටීර හතරකි. පිළී ගඳ වහනය වන රුධිරය සංසරණය වන්නා වූ හෘදය මාංශය ද පිළීගඳින් යුතු ය. ශරීරයේ උඩ දිශාවෙහි උර කුහරය අභ්‍යන්තරයෙහි පිහිටා ඇත.

**12) යකනං - අක්මාව - liver**

කුණු ලේ පැහැයට හුරු අක්මාව ශරීරය අභ්‍යන්තරයෙහි පවතින විශාලම ඉන්ද්‍රිය යි. ශරීරයේ උඩ දිශාවෙහි උදර කුහරයෙහි පිහිටි මෙම කැවුතු මස පිළීගඳ හමන විශාල මස් කුට්ටියක් බඳුය.

**13) කිලොමකං - දලබුසිවිය - pleura**

ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රිය ආවරණය කරමින් ආරක්ෂක පටලයක් වශයෙන් පවතින මෙම දලබුසිවිය 'වැසුනු (පටිච්ඡන්න) දලබුව' ය. 'නොවැසුනු (අපටිච්ඡන්න) දලබුව' ය වශයෙන් දෙයාකාරයෙකි. වැසුනු (පටිච්ඡන්න) දලබුව වනාහි හදවත, පෙණහලු, වකුගඩු ආදිය වසාගෙන පවතින 'ප්ලූරා (pleura) පටලය' වශයෙන් සැලකිය හැකිය. එය ශරීරයේ උඩ දිශාවට අයත්වන අතර නොවැසුනු දලබුව මුළු මහත් ශරීරය පුරාම සමට යටින් මාංශ පේශි වසාගෙන පැතිර පවතී. එය ශරීරයේ උඩ - යට

දෙදිශාවට ම අයත් ය. වැසුනු - නොවැසුනු දලබුසිවිය වර්ණයෙන් සුදු පැහැයට හුරු ය. සියුම් පටපිළියක ස්වභාවයෙන් යුතු පිළිකුල් සහගත පටලයකි.

**14)<u>පිහකං - බඩදිව/ප්ලීහාව - spleen</u>**

බඩදිව, ප්ලීහාව ආදී නම් වලින් ව්‍යවහාර වන මෙම ඉන්ද්‍රිය රුධිරය අධිකව පවතින බැවින් නිල් පැහැයට හුරුය. නාභියෙන් උඩ දිශාවෙහි පිහිටි මෙය හෘදයට වම්පසින් උදරයට ඉහළින් පසෙකින් පිහිටා ඇත. මෙම ඉන්ද්‍රියට හානි පැමිණුනහොත් අධිකව රුධිරය වහනය වී මරණය පවා සිදුවිය හැකි ය. ශරීරාභ්‍යන්තරයෙහි පිහිටි මෙම කොටස් සෑම එකක්ම අධික වූ පිළිගඳින් ද පිළිකුල් සටහනින් ද යුතු ය.

**15)<u>පප්ඵාසං - පෙණහැල්ල/පපුමස - lungs</u>**

වර්ණයෙන් රත් පැහැයට හුරු පෙණහැල්ල ශ්වාසනාලයෙන් දෙකට බෙදී වම් හා දකුණු පෙණහැල්ල වශයෙන් දෙකක් ව පවතී. ශරීරයේ උඩ දිශාවෙහි උරස් කූරයේ පිහිටි මෙම පෙණහැල්ල හදවත ත් අක්මාව ත් වැසෙන සේ ඒ මතින් පිහිටා ඇත. විශාල මුහුදු හත්තක සටහනින් යුතු පෙණහැල්ල වර්ණයෙන්, ගන්ධයෙන් මෙන්ම සටහනින් ද පිළිකුල්ම ය.

**16)<u>අන්තං - බඩවැල (කුඩාබඩවැල හා මහබඩවැල)/අතුනු/අන්ත්‍රය (කුඩා - මහ) - intestines (large, small)</u>**

කුඩාබඩවැල, මහාබඩවැල එක්වීමෙන් සෑදී ඇති අන්ත්‍රය විසි එක් තැනකින් පමණ දරණ ගැසී ශරීරයේ නාභියෙන් උඩ - යට දෙදිශාවෙහිම පිහිටා ඇත. දසත දුර්ගන්ධය වහනය වන්නා වූ නොදිරවූ ආහාර, දිරවූ ආහාර මළ වලින් පිරී තිබෙන මෙම අන්ත්‍රය ලේ ඔරුවක දරණ නමා තැබූ හිස සුන් සර්පයෙකු බඳු පිළිකුල් සටහනින් යුතු ය.

**17)<u>අන්තගුණං - බඩවැල් බැඳුම්/අතුනු බහන් - mesentery</u>**

බඩවැල් දරණ ගැසුණු තැන්වල එම බඩවැල් ගිලිහී නොයනසේ එකට බැඳී ඇති බඩවැල් බැඳුම් වර්ණයෙන් සුදු පැහැති ය. පාපිස්නාවක කොහු ලණු වැටි විසිරී නොයන පරිදි අතරතුරින් පිවිස්වා එකිනෙක සම්බන්ධ කොට ඇති ලණු කැබලි සේ පිළිකුල් සටහනින් යුතු ය. ශරීරයේ උඩ - යට යන දෙදිශාවටම අයත් වන සේ පිහිටා ඇත.

**18)<u>උදරියං - නොදිර වූ ආහාර - gorge</u>**

උදරයෙහි පවතින නොදිර වූ ආහාර අනුභව කළ ආහාරයන්ගේ වර්ණයෙන් යුක්ත ය. උදර පටලයෙහි (ආමාශය) පවතින මෙම නොදිර වූ ආහාර ශරීරයේ උඩ දිශාවට අයත් වේ. දත් වලින් සැපී, ඇඹරී කෙළ සමඟ මිශ වී ගළනාලය දිගේ රූටා ගොස් උදරයට වැටෙන ආහාර එහිදී එක්වන අම්ලයෙන් පැසවමින් ශරීර උෂ්ණත්වයෙන් කැකෑරී පවතී. ගම් කෙළවර ඇති අපද්‍රව්‍ය එක්වන ගවරවළ මෙන් දුටුවන් තුළ මහත් පිළිකුලක් ජනිත කරවන අතර නොදිරූ ආහාර වමනය වීමෙන් නැඟෙන දුර්ගන්ධය ඉතාම පිළිකුල් සහගත ය.

**19)<u>කරීසං - මල - stools / feces</u>**

ආහාර ජීර්ණය වූ පසු ඇතිවන මල වර්ණයෙන් ද සටහනින් ද ඉතා පිළිකුල්ම ය. ආහාරයේ ඕජාව ශරීරයට උරා ගැනීමෙන් පසු ශේෂවන ආහාර කොටස් මල බවට පත්වන අතර අවසානයේදී අන්ත්‍රයේ කෙළවරට එක්රැස් වේ. උණ පුරුකක පඬුවන් මැටි පිරවූ කලෙක මෙන් ශරීරයේ අධෝ භාගයේ රැස්වන මල ශරීරයෙන් බැහැර වූ කල්හි සටහනින් ද ගන්ධයෙන් ද අප්‍රසන්න බැවින් ඉතා පිළිකුල් ය.

**20)<u>මත්ථලුඞ්ගං - හිස්මොළය - brain</u>**

හිස් කබල අභ්‍යන්තරයෙහි පිහිටි හිස් මොළයට අයත් මිදුළු රාශිය වර්ණයෙන් සුදු ය. එනම් නයිහතු පිඩුවක වර්ණයට හුරු ය. මිදී කැටි ගැසී නරක් වූ දී කිරි බඳු සටහනින් යුතු හිස් මොළය පිළිකුල් සටහනින් යුතු ය.

**21)<u>පිත්තං - පිත - bile</u>**

පිත - බද්ධ පිත හා අබද්ධ පිත වශයෙන් දෙයාකාරයකි. බද්ධ පිත, ඝන වූ මී තෙල් බඳු වර්ණයෙන් යුතු වන අතර ශරීරයේ උඩ දිශාවෙහි අක්මාව හා සම්බන්ධ වූ පිත්තකෝෂයෙහි හෙවත් පිත්තාශයෙහි පිරී පවතී. මැලවුණු රණවරා මල් පැහැයට හුරු අබද්ධ පිත ශරීරයේ උඩ - යට දෙදිශාවෙහිම පිහිටි අතර ශරීරය පුරා විහිදී පවතී.

**22)සෙම්හං - සෙම - phlegm**

වර්ණයෙන් සුදු පැහැති සෙම ශරීරයේ උඩ දිශාවට අයත් වේ. සෙවලමය ස්වභාවයක් ගන්නා මෙම සෙම වර්ණයෙන් ද ගන්ධයෙන් ද සටහනින් ද පිළිකුල්ම ය.

**23)පුබ්බෝ - සැරව - pus**

ලේ නරක් වීමෙන් හටගන්නා සැරව පඬුවන් පැහැයට හුරු ය. ශරීරයේ උඩ - යට දෙදිශාවෙහිම සැරව හටගන්නා අතර සැරව එක් රැස්ව පවතින තැනක් නැත. යම්විටක කැපීම් - සීරීම් වශයෙන් ඇතිවන තුවාල නිසා ද සිරුරෙහි හටගන්නා ගඬු - පිළිකා ආදිය නිසා ද ලේ නරක් වීමෙන් ඇතිවන මෙම සැරව වර්ණයෙන්, ගන්ධයෙන් මෙන්ම ස්වභාවයෙන් ද පිළිකුල් ය.

**24)ලෝහිතං - ලේ/රුධිරය - blood**

රුධිරවාහිනී මඟින් ශරීරය පුරා සංසරණය වන ලේ ධාතුව රක්ත වර්ණ ය. පිළිකුල් සහගත පිළිගඳින් යුක්ත ය.

**25)සෙදෝ - ඩහදිය - sweat**

ශරීරයෙහි රෝම කූප අතරින් වෑස්සෙන ඩහදිය පිරිසිදු තලතෙලට හුරු වර්ණයෙන් යුතු ය. ශරීරයේ දහය ඇතිවන අවස්ථාවන්හි රෝම කූපවලින් වෑහෙන මෙම ඩහදිය පිළිකුල් දුර්ගන්ධයෙන් යුතු ය.

**26)මේදෝ - මේද තෙල් - fat**

ශරීරයේ සම ත් මස ත් අතර පිරී පවතින මේදය, වර්ණයෙන් කහ පැහැති ය. ශරීරයේ උඩ - යට දෙදිශාවෙහිම පවතින මෙම මේද තෙල ඉතා පිළිකුල් බැවින් හිස ගැල්වීම් ආදී කිසිදු ප්‍රයෝජනයකට ගනු නොලැබේ.

**27)අස්සු - කඳුළු - tears**

අක්ෂිකූප වලින් වැගිරෙන්නා වූ කඳුළු වර්ණයෙන් පිරිසිදු තලතෙල් බඳු ය. උඩ දිශාවට අයත්වන කඳුළු පිළිකුල් තරලයකි.

**28)වසා- වුරුණු තෙල් - skin oil / grease**

අත්තල, පාතල, නළල ආදී තැන්වල සම මතුපිට ඇති වුරුණු තෙල පිරිසිදු පොල් තෙල් වර්ණයෙන් යුතු ය. ශරීරයේ උඩ - යට දෙදිශාවෙහිම ඇත්තේ ය.

**29)ඛේළෝ - කෙළ - saliva / spittle**

මුඛයෙහි ඇති පෙණ බඳු කෙළ ඒ ඒ අවස්ථාවන්හි ඛේට ග්‍රන්ථීන්ගෙන් වෑස්සී මුඛයෙහි එකතුවන අතර මුවට ගන්නා ආහාර සමඟ එකට මුසු වී ඉතා පිළිකුල් බවට පත්වන්නේ ය.

**30)සඞ්ඝාණිකා - සොටු - mucus / snot**

නාසිකාව අවටින් නාසයට වෑස්සෙන්නා වූ සොටු වර්ණයෙන් හා ස්වභාවයෙන් නොමේරූ තල් ලොඳ, තැඹිලි ලොඳ වලට මදක් හුරු ය. නාස්පුඩු වලින් සොටු වැගිරෙන්නට වූ කල්හි ඉතා පිළිකුල් බවින් යුතු වන අතර සොටු නරක් වූ කල්හි බිත්තර සාරුවෙහි ගන්ධය මෙන් මහත් වූ පිළිගඳින් යුතු ය. නාස් පුඩු වලට එකතු වන මෙම සොටු ශරීරයේ උඩ දිශාවට අයත් වේ.

**31)ලසිකා - සන්ධිලාටු/සඳමිදුළු - oil of the joints**

ඇට සන්ධි අතරෙහි පිහිටි මෙම සන්ධිලාටු වර්ණයෙන් කිණිහිරි ලාටු බඳු ය. ශරීරයේ උඩ - යට දෙදිශාවෙහිම ඇති කුණපප කොටසකි.

**32)මුත්තං - මූත්‍ර - urine**

ශරීරයෙන් බැහැර විය යුතු අපවිත්‍ර ජලය මූත්‍ර වශයෙන් පෙරී මූත්‍රාශයට එක් රැස් වේ. වර්ණයෙන් උඳු ගැරූ දියට මදක් හුරු ය. ගන්ධයෙන් ද ඉතා පිළිකුල් සහගත ය. ශරීරයේ යට දිශාවට අයත් වේ.

ඉහත දක්වන ලද්දේ දෙතිස් කුණුපයන් හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද සාමාන්‍ය විස්තරයකි. මේ අනුව සමාධිය ප්‍රගුණ කළ යුතු ආකාරය අසුභ සමාධිය පිළිබඳ අත්දැකීම් ඇති කල්‍යාණ මිත්‍ර වූ භාවනා ඇදුරෙකු ඇසුරු කරමින් උගත යුතු ය.

මෙම කුණුප කොටස් පිළිබඳව නම් වශයෙන් පමණි, සූත්‍ර දේශනාවන්හි සඳහන් වනුයේ. පාළියෙන් දැක්වෙන එම කුණුප කොටස්වල නාමයන්ට අදාළ විස්තර සඳහන් වනුයේ අට්ඨකථාචාර්ය බුද්ධඝෝස තෙරුන් වහන්සේ විසින් සම්පාදිත 'විසුද්ධිමග්ග' (විශුද්ධි මාර්ගය) ග්‍රන්ථයෙහි ය. එනිසා 'විසුද්ධිමග්ග' විවරණයෙන් බැහැරව, කුණුප කොටස් පිළිබඳව නිවැරදිව අර්ථ දැක්වීම නොකළ හැක්කකි.

***<u>කුණුප කොටස් සාවද්‍ය ලෙස විස්තර කර ඇති ආකාරය පිළිබඳ උදාහරණ කිහිපයක් :</u>***

1. **<u>නහාරු</u>** - නහර : සාමාන්‍ය ව්‍යවහාරයේදී ලේ ගමන් කරන රුධිර වාහිනී සඳහා ද නහර යන පදය භාවිතා වුවත් විසුද්ධිමග්ගයෙහි දැක්වෙන පරිදි 'නහාරු' යන පදයෙන් කියැවෙන්නේ රුධිර වාහිනී නාළ නොව මාංශ පේශී, හා අස්ථි බැඳ තබන 'බන්ධන' හා 'කණ්ඩරා' ය. රුධිර වාහිනී සඳහා පාළියෙන් යෙදී ඇත්තේ 'ධමනි' යන්නයි.

2. **<u>කිලෝමකං</u>** - වර්තමාන ඇතැම් ග්‍රන්ථයක මෙය 'පිත්තාශය' ලෙස වරදවා දක්වා ඇත. පාළියෙන් පිත්තාශයට කියනු ලබන්නේ 'පිත්තකෝස' කියා යි. කිලෝමකං යනු 'දලබුසිවිය' යි.

3. **<u>අන්තං</u>** - ඇතැම් ග්‍රන්ථවල මෙය කුඩාබඩවැල නොහොත් මහබඩවැල ලෙස වරදවා දක්වා ඇත. 'අන්තං' හෙවත් අන්ත්‍ර යන්නෙන් අදහස් කෙරෙන්නේ උදරයේ පටන් අධෝ මාර්ගය දක්වා කුඩා, මහාබඩවැල් සහිත මුළු මහත් ආහාර ජීර්ණ මාර්ගය යි.

4. **<u>අන්තගුණං</u>** - ඇතැම් ග්‍රන්ථවල මෙය ද කුඩාබඩවැල නොහොත් මහබඩවැල ලෙස වරදවා දක්වා ඇත. 'අන්තගුණං' හෙවත් 'අතුණුබහන්' යන්නෙන් අදහස් කෙරෙන්නේ බඩවැල් නොවිසිරී යන ලෙස එකට බැඳ තබන බන්ධනයන් ය.

5. **<u>උදරියං</u>** - වර්තමාන සතිපට්ඨාන විවරණ ග්‍රන්ථයක මෙය 'ආහාර බොක්ක' ලෙස වරදවා දක්වා ඇත. පාළියෙන් ආහාර බොක්ක හෙවත් ආමාශයට කියනු ලබන්නේ 'උදර' කියායි. 'උදර'යෙහි තිබෙන නොදිරවූ ආහාර 'උදරියං' නම්.

වර්තමාන ඇතැම් සතිපට්ඨාන විවරණ ග්‍රන්ථවල මෙන්ම ඇතැම් සූත්‍ර පරිවර්තනවල ද මෙම කුණුප කොටස් වරදවා අර්ථ දක්වා ඇති අයුරු දක්නට ලැබෙන බැවින් වරද නිවැරදි කරගෙන, නිවැරදි ලෙස කුණුප කොටස් තේරුම් ගෙන වීර්යයෙන් යුතුව සමාධිය ද වඩා ආර්යඅෂ්ටාංගික මාර්ගය සම්පූර්ණ කරගනිමින් මෙබඳු පිළිකුල් කයක් ඇතිව යළි නූපදිනු පිණිස වෑයම් කරමු.

**සාධු ! සාධු !! සාධු !!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**

ආශ්‍රිත ග්‍රන්ථ -

- බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සූත්‍ර ග්‍රන්ථ
- විසුද්ධිමග්ග (පාළි)
- සිංහල විශුද්ධි මාර්ගය (මාතර ශ්‍රී ධර්මවංශ නාහිමි)
- The path of purification (Ven. Ñānamōli)

*(කුණුප කොටස් පිළිබඳ පැරණි විවරණයන්ට අනුරූපවන වත්මන් සිංහල - ඉංග්‍රීසි ව්‍යවහාරයන් තහවුරු කරගැනීමට සහාය වූ වතුපිටිවල මහා රෝහලේ වෛද්‍ය සුනෙත් ජයසිංහ උපාසක මහතාට ද වහා ශ්‍රී සද්ධර්මය අවබෝධ වේවා!)*


- **<u>Copyright © Sri Saddharmma Sansadaya, Dhammarama Yogashramaya. 2005</u>**